ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය

කොළඹ

ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 201802026

එක්සත් ජනපද ස්වේච්ඡා සාම ප්‍රජාව (Peace Corps) **තම වැඩසටහන ශ්‍රී ලංකාවේ නැවත ආරම්භ කරයි.**

කොළඹ, පෙබරවාරි 26, 2018: ශ්‍රී ලංකාවේ සාම ප්‍රජා වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීම සඳහා නව ද්වි-පාර්ශවික ගිවිසුමකට එක්සත් ජනපද සාම හමුදාවේ වැඩබලන අධ්‍යක්ෂ ශීලා ක්‍රොව්ලි සහ ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍ය තිලක් මාරපන විසින් අත්සන් කරන ලදී. අරලියගහ මන්දිරයේ පැවති මෙම අත්සන් කිරීමේ අවස්ථාවට ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති අතුල් කෙෂප් හා ශ්‍රී ලංකා අගමැති රනිල් වික්‍රමසිංහ ද සහභාගි වූහ. මෙම නිවේදනය එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර තානාපති සබඳතා ස්ථාපිත කිරීමේ 70 වැනි සංවත්සරය හා සමපාත වන අතර එය රටවල් දෙක අතර ඇති සහයෝගිතාවේ දීර්ඝ ඉතිහාසය හා අන්‍යෝන්‍ය ආධාර ද අවධාරණය කරයි.

ශ්‍රී ලංකාවේ සාම ප්‍රජාවේ කටයුතුවල දී ප්‍රමුඛ ස්ථානය දෙනු ඇත්තේ ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනයටයි. ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු මෙම ස්වේච්ඡා සේවකයන්ට මාස තුනක පරිපූර්ණ සංස්කෘතික, භාෂා හා තාක්ෂණික පුහුණුවක් ලබා දෙනු ඇත. අවුරුදු දෙකක් සේවය කිරීම සඳහා වූ ඔවුන්ගේ පත්වීම් ලබා දෙන්නේ ඉන් පසුවයි. මුල් සාම ප්‍රජා කණ්ඩායම 2019 සැප්තැම්බර් මාසයේ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතයි.

“සාම ප්‍රජාව නැවත ශ්‍රී ලංකාවට පැමිණීම ගැන මම ඉතා සතුටු වෙමි. අපේ ස්වේච්ඡා සේවකයන් සමානත්වයේ හා හවුල් සෞභාග්‍යයේ පරමාදර්ශ මෙන් ම සාමකාමී ස්ථාවර ලෝකයක් පිළිබඳ පොදු අපේක්ෂාවන් ද ප්‍රවර්ධනය කරයි“ යනුවෙන් අදහස් පළ කළේ ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති අතුල් කෙෂප් ය. සාම ප්‍රජාව බිහි කළ විධායක නියෝගය අත්සන් කරමින් ජනාධිපති ජෝන් එෆ් කෙනඩි ප්‍රකාශ කළේ “අපේ සාම ප්‍රජාව සැලසුම් කර ඇත්තේ රාජ්‍ය තාන්ත්‍රික හෝ ප්‍රචාරණ හෝ මතවාදී ගැටුම් සඳහාවූ මෙවලමක් ලෙස නොවේ. එය සැලසුම් කර ඇත්තේ ලෝක සංවර්ධනය නම් ශ්‍රේෂ්ඨ පොදු අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා අපේ ජනතාවට පූර්ණ ලෙස ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට හැකි වන ආකාරයට“ බවයි.

වර්ෂ 1962 සිට 1998 දක්වා වූ කාලය තුළ අධ්‍යාපනය, සෞඛ්‍යය හා තරුණ සංවර්ධනය යන අංශවල කටයුතු කළ සාම ප්‍රජා ස්වේච්ඡා සේවකයන් 370ක් ශ්‍රී ලංකාවේ සේවය කර තිබේ. දේශපාලන අස්ථිර බව නිසා මෙම වැඩසටහන 1998 දී තවතා දමන ලදී. දැන් සාම හමුදා ප්‍රතිචාරය යනුවෙන් හඳුන්වන අර්බුද අවස්ථාවන්හි පිහිටට එන සාම හමුදා කණ්ඩායමක් 2004 ඉන්දියානු සාගර සුනාමි ව්‍යසනයෙන් පසු සහන කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණ ඇත. නැවතත් ශ්‍රී ලංකාවට පැමිණ රටේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සහාය වන ලෙස ශ්‍රී ලංකා රජය 2016 වර්ෂයේ දී සාම ප්‍රජාවට ආරාධනය කළේය.

“සාම ප්‍රජාව ශ්‍රී ලංකාවට නැවත පැමිණීම, පසුගිය අවුරුදු 70 තුළ අප දෙරට අතර වර්ධනය වූ මිත්‍රත්වය තව දුරටත් ශක්තිමත් කර ගැනීමට ලැබෙන අවස්ථාවකි“ යයි සාම ප්‍රජාවේ වැඩබලන අධ්‍යක්ෂක ශීලා ක්‍රොව්ලි ප්‍රකාශ කළාය. “මේ සුන්දර දිවයිනේ ශ්‍රී ලාංකිකයන් සමග වැඩ කිරීමට සාම ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ට ආරාධනය කිරීම ගැන අපි ශ්‍රී ලංකා රජයටත් එහි ජනතාවටත් ස්තුතිවන්ත වෙමු“ යයි ඇය වැඩි දුරටත් ප්‍රකාශ කළාය.